

# හිතවතුනි මේ ඔබේ මිනිස්කමයි





**පසුගිය වසරේ සන්නස පුවත් පතේ ජූලි මස කලාපයේ "ඔවුනට ඔබේ පිහට අවශ්‍යයි" යන මැයෙ න් පල වු ලිපිය සමහර විට ඔබ මතකයේ ඇති. එහෙත් එම පුවත වව්නියාව නගරයේ දුෂ්කර ගම්මානයක් වන සැළළිහිණිගම අසරණ දුගි පවුලක ජිවිත වෙනස් කළ බව සමහර විට ඔබ නො දන්නවා ඇති.**

ඔබගේ මතකය යලි අවදි කිරීමට, මෙම ව්‍යාපෘතියේ සාරාංශ කතාව මෙසේ ඉදිරිපත් කරන්නම්.

එම අසරණ පවුලේ පියා (උපුල් විජේකුමාර) මී මැස් මොර රෝගියෙක්. කුඩා පුතු දෙපා අප්‍රාණික රෝගයකට (Meningocele) අමතරව මොළය හා සම්බන්ධ රෝගයකිනද (Hydrocephalus) පෙලුණා. අම්මාට (දුලාන්ජලී කුමාරි) රෝගී දරුවාගේ උපස්ථාන හැර වෙන දෙයක් කරන්න හැකියාවක් නැහැ.

ඔවුන් ජීවත් වුනේ ඉටිකොළ හා තහඩු ආවරණය කළ පැළක. දරුවාගේ රෝගි තත්වයට වියදම් කිරීමට කුලී වැඩ කරන උපුල්ට හැකියාවක් තිබුනෙ නැහැ. අපගේ අරමුණ වුයේ මේ පවුල ජීවත් කිරීමට යම් උපකාරයක් කිරීම, නමුත් මවගේ ආයාචනය වූයේ පුතුගේ අසනීප සුව කර දෙන ලෙසය.

ඒ අනුව කුඩා පුතු පරීක්ෂණ කටයුතු සඳහා යාපනය මහ රෝහලේ ස්නායු විශේෂඥ සංජීව ගරුසිංහ මහතා වෙත යොමු කෙරුනා. වෛද්‍ය නිගමණය වුනේ Hydrocephalus රෝගයට ප්‍රතිකර්මයක් ලෙස ශල්‍යකර්මයකින් shunt පද්ධතියක් සවි කළ යුතු බවත් එසේ නොකළ හොත් සිරු රේ අනකුෙත් අවයව සහ පද්ධති අකර්මන්‍ය වීමට ඉඩ ඇති බවත්ය. ඒ අනුව Programmable Shunt පද්ධතියක් ඇපලෝ (ලංකා) රෝහලේදී සවි කිරීමට නිගමනය විය.
මෙය පහසු කාර්යයක් නොවන බව අපට වැටහුණද, එම අසරණ පවුලේ ශෝචනීය තත්වය අපට අමතක කිරීමට නොහැකි වුනා. දරුවාගේ ශල්‍යකර්මය සඳහා වැය වන මුදල රැස් කර ගැනීමට හැකිවේවි යන විශ්වාශය අප මිතුරු කැල තුල ගොඩ නැගුනා. එහි ප්‍රථම පියවර ලෙස ජගත් ජේ. එදිරිසිංහ මහතාගෙන් සන්නස පුවත් පතේ පුංචි ඉඩක් ලබාදෙන මෙන් කල ඉල්ලීමට ඔහුගේ පිලිතුර වුනේ එවැනි කටයුතු වෙනුවෙන් සන්නස පුවත් පත ඕනම වෙලාවක විවෘත බවයි.

එහි ප්‍රතිපලයක් ලෙසින් 2015 ජූලි මස සන්නස පුවත් පතේ ඡායාරූප සහිතව මෙම විස්තරය පල කෙරුනා. ඉන්පසු විල්ප්‍රඩ් සිරිවර්ධන මහතාගේ කාරුණික අනුග්‍රහයෙන් 2015 අගෝස්තු මස සිහනද පුවත් පතේද ලිපියක් පළ විය. ඒ දැක්වූ උපකාරය වෙනුවනේ සන්නස සහ සිහනද පුවත් පත් වලට අපගේ ස්තුතිය. ඒ සමගම ශ්‍රී ලාංකීය වෙලඳ සැල් වලද දැන්වීම් පළ කෙරුනා.

එම පුවත් පත් සහ දැන්වීම් මෙම ව්‍යාපෘතියේ හැරවුම් ලක්ෂය වුනා. මෙපුවත් කියවා කම්පා වූ හදවත් ඇති බොහෝ දෙනෙකු අපට කතා කලා. පෞද්ගලිකව නොහඳුනන බොහෝ දෙනෙකේ ඒ අතර සිටියා.

Sooriya Marketing Services අධිපති දයාන් රණසිංහ මහතා විශේෂ කැපවීමකින් මෙහි ප්‍රචාර කටයුතු කර අතිවිශාල අවධානයක් මෙම සත්කාර්යය වෙනුවනේ ලබා ගත්තා.
ආචාර්ය ලොයිඩ් ගුණතිලක මහතා දරුවාගේ ශල්‍යකර්මය වෙනුවෙන් $5000 ක් ලබා දුන්නා.
විධායක සූපවේදී ගුණෝරිස් මහතා නිවසක් ඉදිකරීම් කටයුතු වෙනුවෙන් $5000 ක මුදලක් පරිත්‍යාග කළා. නව නිවසට අවශ්‍ය ගෘහ භාණ්ඩ ලබාදීමට සරත් විජේසූරිය මහතා ඉදිරිපත් වුනා. නොසිතූ ලෙස මුදල් ආධාර ලබා දීමට පින්වතුන් බොහෝ දෙනෙක් ඉදිරිපත් වීම අපිට විශාල ශක්තියක් ඒ වගේම ධෛර්යයක් වුනා කීවොත් නිවැරිදියි.

අපගේ මූලික අරමුණ වුනේ දරුවාගේ ශල්‍යකර්මයට අවශ්‍ය වන මුදල් සොයාගැනීමයි. නමුත් නව නිවසක් සඳහාත් පරිත්‍යාග ලැබීමේ හේතුවනේ මේ කාර්යයන් දෙකම ඉටු කිරීමට අප මිතුරු කැල රොක්වුනා.

දරුවාගේ Hydrocephalys රෝගය "ශල්යකර්මයකින් සුව කල හැකි වුනත් අප්‍රාණික දෙපා (Meningacele) නුදුරු අනාගතයේ සුව කල නොහැකි බවයි වෛද්‍ය නිගමනය වුනේ. දරුවාගේ අප්‍රාණික දෙපා වලට සරිලන පරිදි නිවස සෑදිමට ඇස්තමේන්තු කළ මුදලට වඩා වැඩි මුදලක් අවශ්‍ය වූ බැවින් එම අමතර මුදල් සොයා ගැනීම සදහා අප 2015 ඔක්තෝබර් 16 දින RoxburghPark Good Samaritan Church Hall හිදී ආප්ප රාත්‍රියක් පැවැත් වූවා. මේ කටයුත්තට සන්නස සිහනද පුවත් පත් වගේම Lakmihira" Sihala FM" 3ZZZ" Swarna FM ගුවන් විදුලි නාලිකාත්, Melbourne Events" Go events සහ Sri Lankan Events යන අන්තර්ජාල මාධ්‍ය වලිනුත් විශේෂ අනුග්‍රහයක් ලැබුනා. ඉතා සහන මිලකට ප්‍රනීත ආහාර වේලක් සැපයීම වෙනුවනේ අපගේ විශේෂ ස්තුතියක් Desha Catering අධිපති දේශප්‍රිය මහතාට. Rhydmic Band (කනිෂ්ක) සහ Black Ice Entertainment (සුනන්ද කුරේ) එකතුව නොමිලේ මේ රාත්‍රිය සංගීතයෙන් රසවත් කළා. ඩෙන්සිල් ජයවීර සහ චමින්ද රන්දනෙිය මහතුන් විශේෂ අනුග්‍රයක් ලබා දුන්නා වෙන්දේසි භාන්ඩ සැපයී මෙන්.

ඉතා සාර්තක වූ එම ආප්ප රාත්‍රියෙන් ඩොලර් 6952 ක මුදලක් රැස් කිරීමට අපට හැකි වුනා. එයට සහභාගී වූ අයටත් නන් අයුරින් උපකාර කල සැමටත් අපගේ ස්තුතිය.

2015 අගෝස්තු 7 දින දුලාන්ජලි මහත්මිය ජීවිතයේ පලමු වතාවට කොළඹ පැමිණියා. ඒ තම මාස 15 ක් වයසැති කුඩා පුතුගේ ශල්යකර්මය සදහා ඇපලෝ (ලංකා) රෝහලේදී ස්නායු වෛද්‍ය සංජිව ගරුසිංහ මහතා මුණාගැසීමටයි. මේ අනුව ශල්‍යකර්මය සදහා සම්පූර්ණ වියදම රු 4,50,000 ක් විය ( Shunt පද්ධතිය සදහා රු 1,50,000 ද වෛද්‍ය සහ රෝහල් ගාස්තු ඝි. 3,00,000 ක්ද). රෝග නිරීක්ෂණයේ සිට මේ දක්වා ස්නායු විශේෂඥ සංජීව ගරුසිංහ මහතාගෙන් වන සේවය අති විශාලයි, ප්‍රශංසනීයයි. සෑම මාස තුනකට වරක්ම මේ කුඩා දරුවා යාපනය රෝහලේදී වෛද්‍ය ගරුසිංහ මහතාගේ පරීක්ෂාවට ලක් වෙනවා. රෝහල් කටයුතු සම්භන්ධීකරණයනේ අපට උදව් කල ඇපලෝ රෝහල් කාර්යමඩුල්ලේ අයේෂිකා අල්විස් මහත්මියට අපගේ විශේෂ ප්‍රණාමය.

මෙලෙස වෛද්‍ය ප්‍රතිකාර ලබන අතරේ නව නිවසේ කටයුතුත් සාර්තකව නිමා වුනා. මේ අසරණ පවුල වඩාත් සතුටු වූ දිනය වන්නට ඇත්තේ 2016 ජනවාරි 13 වනදා වෙන්න ඇති. ඒ ඔවුන් නව නිවසට ගෙවැදුන දවස. සර්වරාත්‍රික පිරිත් සජ්ජායනයකින් පසු ඔවුන් නව නිවසේ පදිංචියට



ශල්‍යකර්මයෙන් පසුව

පැමිණියා.

මෙම නිවස ඉදි කිරීම් කටයුතු වෙනුවෙන් Rs' 12,50,000 ක මුදලක් වැය වුනා. අප දන්නා හදුනන මාධ්‍යවේදියෙකු වු මාදව කුලසූරිය මහතා වව්නියාවෙ සිට මෙම කටයුතු සම්බනධීකරණය කළා.

උපුල් සහ දුලාන්ජලීගේ මුල් නිවසේ ඡායාරූපය අපගේ මෙම සාමුහික ප්‍රයත්නය මෙ අසරණ ජීවිත වලට සැබෑ වෙනසක් කල බවට කියවෙන කදිම සාක්ෂියක්. එම අසරණ පවුලට මෙන්ම අපටද මෙය දිගු සිහිනයක නිමාවක්.

නව නිවසේ ඉදි කිරීම් කටයුතු සිදුවෙන අතර තුර මෙම ගම් වැසියන්ට උග්‍ර ජල ප්‍රශ්ණයක් පවතින බව අපට දැන ගන්නට ලැබුනා. ඔවුන් බීමට දිය බිදක් සොයාගෙන සැතපුම් ගණනාවක් ගමන් කරනව. ෙ තතු දැනගත් අරවින්ද සුභසිංහ මහතා යන්ත්‍රානුසාරයනේ ක්රියා කරන නළ ලිදක් වෙනුවනේ ඩොලර් 1500 ක මුදලක් ලබා දුන්නා.
ඝි. 1,30,000 කින් අපට නල ලිඳ සාදා නිම කිරීමට හැකිවුනා.

ආචාර්ය ලොයිඩ් ගුණතිලක මහතා සැළළිහිණිගමට ගිය අවස්ථාවේ ගම් වැසියන් මුහුන දෙන මේ උග්‍ර ජල ප්‍රශ්නය සියැසින් දැක තවත් නල ලිදකට අවශ්‍ය මුදල් (ඩොලර් 1400) පරිත්‍යාග කළා.

මෙම නල ලිං මේ වනවිට පවුල් ගණනාවකට ජල සම්පත සපයනව.

මෙම ව්‍යාපෘතියෙදි ඔබ සැම අප කෙරෙහි තැබූ විශවාශය කෘතගුණ පූර්වකව සිහිපත් කරන්නෙමු. මුදලින් මෙන්ම වචනයෙන් ක්‍රියාවෙන් ඔබ ලබා දුන් සහයෝගය ඉතා අගය කොට සලකමු. මෙම නිවස සහ දරුවාගේ සුවදුක් බැලීමට ගිය සැමගේ මතය වන්නේ මෙය සාර්ථකව නිමවූ කාර්යයක් බවයි. ඔබටත් ලංකාවට ගිය දිනක මෙම තත්වය සියැසින් දැක බලා ගැනීමට හැකියි. ඔවුනගේ ලිපිනය. අංක 964, 4 වන පටුමග, සැළළිහිණිගම, බෝගස්වැව, වව්නියාව, දුරකථන අංකය * 077 594 3622.

මෙම කාර්යයට මුදලින් ආධාර කළ සහ සැළළිහිණිගමට ගිය සැමගේ ඉල්ලීම වූයේ කවර හෝ අසරණ පවුලකට හෝ ගමකට අවශ්‍ය දෑ සපුරා ලීම සඳහා තවත් මෙවන් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලෙසයි. අප මිතුරු කැල මේ වෙනුවනේ මාසිකව අඛණ්ඩ දායකත්වයක් පවත්වාගෙන යනවා.

අප දන්නවා මෙවැනි අසරණ අය වෙනුවෙන් පිහිට වීමට කැමති බොහෝ දෙනෙක් ඔස්ට්‍රේලියාවෙ සිටින බව.ඒ සමගම ඔබේ සිතේ ඇතිවන ප්‍රශ්නයත් අප දන්නවා. ඒ ආධාර නිසි තැනට ලැබෙනවාද කියන පැනය. මෙම ව්‍යාපෘතියේදී එය නිසි අයුරින් ඉටු වූ බව අපට විශ්වාසයි.

සැමදා දුක උරුම වුන පවුලකට සිනහවක් දෙන්න ඔබත් කැමතිනම් හෝ සැළළිහිණිගම පිළිබදව වැඩිදුර විස්තර දැනගැනීමට කැමතිනම් අමතන්න,

සුමේදා පරණවිතාන * 0423 688 482
තේජා පෙරේරා * 0434 165 507
නයනා වීරක්කොඩි * 0425 787 484
රසිකා සුරවීර * 0403 303 585